සැ. යු. - 2015.01.30 වැනි දින පළ වූ අංක 1900 දරන ගැසට් පත්‍රයේ I : I, III හා IV (අ) කොටස් පළ නොවීය.

*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2012 වර්ෂයේ අප්‍රේල් සිට ජුනි දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,901 - 2015 පෙබරවාරි මස 06 වැනි සිකුරාදා - 2015.02.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 164 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 164 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 166 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 171 |


*සැ. යු.* - ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2015 ජනවාරි මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 පෙබරවාරි මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 පෙබරවාරි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ S -9 ඩීසල් මල්ටිපල් ඒකකයන්හි (S -9 Diesel Multiple Units) (පවර් සෙට්) සඳහා නව මැදිරි පාලන පද්ධතියක් (New Car Control System) සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා වූ ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංක : **SRS/F 7008**

01. ශ්‍රී ලංකාව කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ අංක 01හි ප්‍රවාහන අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති තැන විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ **S -9** ඩීසල් මල්ටිපල් ඒකකයන්හි (පවර් සෙට්) නව මැදිරි පාලන පද්ධතියක් අලුත්වැඩියා කිරීමට නිෂ්පාදකයින්/කොන්ත්‍රාත්කරුවන් හා අනෙකුත් හැකියාවැති ආයතන වලින් මුද්‍රා තබන ලද ලංසු සඳහා දැන් ඇරයුම් කෙරේ. ලංසුකරුවන්ට තම ලංසු ඍජුවම හෝ ඇටෝර්නි බලය පවරන ලද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පිළිගත් නියෝජිතයින් මගින් ඉදිරිපත් කළ හැක.

02. 2015.02.19 වැනි දින ප. ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් කරනු ලැබේ.

03. ආපසු නොගෙවන රු. 5,000 ක් හෝ ඒ සමාන නිදහසේ පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් එම ප්‍රසම්පාදන ගාස්තුව ගෙවා, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඔල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ විදේශීය ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් 2015.02.18 වැනි දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ලබාගත හැකි ආකෘතිපත්‍රවල සටහන් කරනු ලැබූ ලංසු පමණක් භාරදිය යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් කළ වහාම එම ලංසු ශ්‍රී ලංකාව, කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 01 දරන ස්ථානයේ ප්‍රවාහන අමාත්‍යාංශයේ දී විවෘත කරනු ලබන අතර ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙනවිත් පහත සඳහන් ලිපිනය වෙත භාරදිය හැක.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ලේකම් බාරේ,
ප්‍රවාහන අමාත්‍යාංශය,
අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාව කොළඹ 10, ඔල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගාස්තුවකින් තොරව ලංසු ලියවිලි පරීක්ෂා කර බැලිය හැක.

*වැඩිමනත් විස්තර සඳහා කරුණාකර පහත ලිපිනය අමතන්න.*
දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඔල්කට් මාවත,
කොළඹ, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2473328
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk
යොමු අංක : SRS/F. 7008

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය.

02-86

# බඩු බාහිරාදිය විකිණීම්

### දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - වව්නියාව

භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වව්නියාව මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවරුණු නඩු වලින් රාජසන්තක කරන ලද අයිතිකරුවන් නොමැති පහත සඳහන් භාණ්ඩ 2015.03.14 වැනි දින පෙ. ව. 9.30 සිට මෙම අධිකරණයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙම නඩු භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිය කියා සිටින යම් තැනැත්තෙකු වේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම අයිතිය පිළිබඳ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

02. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

03. ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

04. භාණ්ඩ මිලදී ගත් වහාම අදාල මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් ඉවත් කර ගත යුතු ය. ගෙවීම සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

05. නඩු භාණ්ඩ මිලදී ගන්නා අය තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

වී. රාමකමලන්,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
වව්නියාව.

2015 ජනවාරි මස 13 වැනි දින.

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව දිසා මහෙස්ත්‍රාත් අධිකරණය වවුනියාව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | තක්සේරු කළ මුදල | වෙන්දේසි කළ මුදල |
|---|---|---|---|---|---|
| 1. | 93087 | අලවංගු | 01 | | |
| 2. | 73339 | අලවංගු | 01 | | |
| 3. | 72979 | අලවංගු | 01 | | |
| 4. | 95668 | අලවංගු | 01 | | |
| 5. | 69238 | අලවංගු | 01 | | |
| 6. | 93542 | අලවංගු | 01 | | |
| 7. | 88526 | අලවංගු | 02 | | |
| 8. | 88613 | අලවංගු | 01 | | |
| 9. | 95544 | අලවංගු | 01 | | |
| 10. | 85672 | අලවංගු | 01 | | |
| 11. | 88529 | අලවංගු | 01 | | |
| 12. | 90635 | අලවංගු | 01 | | |
| 13. | 69238 | අලවංගු | 02 | | |
| 14. | 90553 | අලවංගු | 01 | | |
| 15. | 87811 | අලවංගු | 01 | | |
| 16. | 93087 | අලවංගු | 02 | | |
| 17. | 97070 | අලවංගු | 01 | | |
| 18. | 98701 | අලවංගු | 02 | | |
| 19. | 96180 | පොරොව | 01 | | |
| 20. | 50372 | පොරොව | 01 | | |
| 21. | 94563 | පොරොව | 01 | | |
| 22. | 92635 | පොරොව | 01 | | |
| 23. | 53851 | පොරොව | 01 | | |
| 24. | 96636 | පොරොව | 01 | | |
| 25. | 89746 | පොරොව | 01 | | |
| 26. | 52754 | පොරොව | 01 | | |
| 27. | B 99/14 | පොරොව | 01 | | |
| 28. | 97862 | පොරොව | 01 | | |
| 29. | 98701 | පොරොව | 01 | | |
| 30. | 42207 | මිට දිගකැති | 01 | | |
| 31. | 62893 | මිට දිගකැති | 01 | | |
| 32. | 88526 | මිට දිගකැති | 01 | | |
| 33. | 74800 | මිට දිගකැති | 01 | | |
| 34. | 88268 | මිට දිගකැති | 01 | | |
| 35. | 72889 | මිට දිගකැති | 01 | | |
| 36. | 76044 | මිට දිගකැති | 01 | | |
| 37. | 86426 | මිට දිගකැති | 01 | | |
| 38. | 88576 | පිකැස් | 01 | | |
| 39. | 95668 | පිකැස් | 02 | | |
| 40. | 71166 | පිකැස් | 01 | | |
| 41. | 89360 | පිකැස් | 01 | | |
| 42. | 98701 | පිකැස් | 01 | | |
| 43. | 94639 | උදලු | 01 | | |
| 44. | 95668 | උදලු | 01 | | |
| 45. | 73339 | උදලු | 02 | | |
| 46. | 82492 | උදලු | 01 | | |
| 47. | 98701 | උදලු | 02 | | |
| 48. | | උදලු | 05 | | |
| 49. | 54016 | කුලුගෙඩි | 01 | | |
| 50. | 93087 | කුලුගෙඩි | 01 | | |
| 51. | 73339 | කුලුගෙඩි | 01 | | |
| 52. | 98701 | කුලුගෙඩි | 01 | | |
| 53. | - | කුලුගෙඩි | 04 | | |
| 54. | - | ඇල්කතීන් වතුර බට | 02 | | |
| 55. | - | MEC TV යන්ත්‍ර | 01 | | |
| 56. | - | SINGER මහන මැෂින් උඩ කොටස | 01 | | |
| 57. | - | වතුර මෝටර් 1 1/2 | 01 | | |
| 58. | - | විදුලි මෝටර් | 01 | | |
| 59. | 56473 | Lumala පාපැදි 55707067 | 01 | | |
| 60. | B1536/12 | ගෑස් සිලින්ඩර් | 01 | | |
| 61. | B1845/12 | ගෑස් සිලින්ඩර් | 01 | | |
| 62. | 57247 | Lumala පාපැදි 55565219 | 01 | | |
| 63. | 93827 | ජංගම දුරකථන Micro max | 01 | | |
| 64. | 98282 | ජංගම දුරකථන E-Tel | 01 | | |
| 65. | 97437 | ජංගම දුරකථන Greentel | 01 | | |
| 66. | 95791 | ජංගම දුරකථන NOKIA | 01 | | |
| 67. | 97160 | ජංගම දුරකථන AG – TEL leader | 01 | | |
| 68. | 97260 | ජංගම දුරකථන NOKIA | 01 | | |
| 69. | 97621 | ජංගම දුරකථන Lima | 01 | | |
| 70. | 95626 | ජංගම දුරකථන Nokia | 01 | | |
| 71. | 96879 | ජංගම දුරකථන E-Tel | 01 | | |
| 72. | 97788 | ජංගම දුරකථන Greentel | 01 | | |
| 73. | 98062 | ජංගම දුරකථන Micromax | 01 | | |
| 74. | 97436 | ජංගම දුරකථන NOKIA | 01 | | |
| 75. | 98188 | ජංගම දුරකථන MP-man | 01 | | |
| 76. | 97620 | ජංගම දුරකථන SAMSUNG | 01 | | |
| 77. | 97797 | ජංගම දුරකථන NOKIA | 01 | | |
| 78. | 97379 | ජංගම දුරකථන NOKIA | 01 | | |
| 79. | 97379 | ජංගම දුරකථන Micro max | 01 | | |
| 80. | - | සූර්ය බල පැනලය | 01 | | |

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස මෙසේ දැනුම් දෙනු ලැබේ.

මාතර, වැලිවේරිය, සරම්මුදලි මාවත, අඹගහකොරටුව යන ලිපිනයෙහි පදිංචි ඉන්ද්‍රසිරි කමල්ගොඩ ලියනගේ වන මා විසින් එම ලිපිනයෙහි ම පදිංචි සෝමසිරි කමල්ගොඩ ලියනගේ මහතා වෙත බලය පවරමින් ලියාපදිංචි කර ඇති, බින්දු වික්‍රමසේකර ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් සහතික කළ අංක 142 සහ 1995.05.20 දිනැති ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ශූන්‍ය කර බල රහිත කර සිටිමි.

මෙතැන් සිට එකී සෝමසිරි කමල්ගොඩ ලියනගේ මහතා විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුලත්වනු ලබන කිසිම ගිවිසුමක් සම්බන්ධයෙන් මා වගකියනු නොලබන බව ද මෙයින් දැනුම් දෙමි.

02-03

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එදිරිසිංහ කුෂන් වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 62321
ලියාපදිංචි කාර්යාලය : නුවර පාර, කලල්පිටිය, පස්යාල
ලියාපදිංචි දිනය : 2007.12.27

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.

02-18/1

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : පුංචි කාර් කැබ්ස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ අංකය : පී වී 102719
ලියාපදිංචි කාර්යාලය : අංක 311, කඩුවෙල පාර, මාළඹේ
ලියාපදිංචි දිනය : 2014.12.10

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.

02-18/2

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අම්බලන්ගොඩ, ඌරවත්ත "ශ්‍රියාවාස" හි පදිංචි නල්ලාහන්දි සිඩ්නි පියදාස ද සිල්වා වන මා විසින් අම්බලන්ගොඩ, ඌරවත්ත "ශ්‍රියාවාස" හි පදිංචි නල්ලාහන්දි වොලී පියදාස ද සිල්වා යන අය වෙත ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩබ්ලිව්. ද සිල්වා මහතා ලියා සහතික කල අංක 336 සහ 2012.12.15 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලබන බවත් එකී නල්ලාහන්දි වොලී පියදාස ද සිල්වා යන අය විසින් එකී ඇටෝර්නි බලපත්‍රය මත මින් ඉදිරියට කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වගකියනු නොලබන බවත් ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට මා නොබැඳෙන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

නල්ලාහන්දි සිඩ්නි පියදාස ද සිල්වා.

2015 ජනවාරි මස 06 වැනි දින.

02-22

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : අල්අතාස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2014 දෙසැම්බර් මස 4
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 102608
ලියාපදිංචි කාර්යාලය : අංක 65 ඒ, විහාර මාවත, කොලොන්නාව.

අධ්‍යක්ෂක.

02-27

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : ප්ලැන් මයි ගැප් ඉයර් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 21/7, නුගේතුඩුව පාර, පොල්වත්ත, අම්බලන්ගොඩ
සංස්ථාගත කළ දිනය : 2014 නොවැම්බර් මස 19
ලියාපදිංචි අංකය : පී වී 102235

ලේකම්.

02-28

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය අනුව පහත සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සදර්න් හවුස් ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 103022
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 218/37, වල්පිට, බටවල, පාදුක්ක.

02-35

---

### සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන ජේදය යටතේ කරනු ලබන දැනුම් දීමයි

සමාගමේ නම : ලංකා බියෝ ෆර්ටිලයිසර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 96947
දිනය : 2014.02.07
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 377/56, වැල්සිරි මාවත, හෝකන්දර දකුණ, හෝකන්දර.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02
2014 පෙබරවාරි මස 18 වැනි දින.

02-39

---

### සීමාසහිත වගකීම් සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන ජේදය යටතේ කරනු ලබන දැනුම් දීමයි

සමාගමේ නම : සී. ටී. ප්‍රොපටි වොක්ෂොල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 96645
දිනය : 2014.01.23

සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 28 වැනි මහල, වෙස්ට්ටවර් වර්ල්ඩ් ට්‍රේඩ්සෙන්ටර්, එච්ලොන් ස්කොයර්, කොළඹ 01.

බිස්නස්මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 45, බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02,
2014 පෙබරවාරි මස 18 වැනි දින.

02-40

---

### දැන්වීම

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දැන්වමු.

සමාගමේ නම : රොනැස්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 101298
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 324/1 සී, එකමුතු මාවත, තලංගම උතුර, බත්තරමුල්ල.
ලියාපදිංචි දිනය : 2014.10.03

ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු.

02-66

---

### දැන්වීම

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දැන්වමු.

සමාගමේ නම : ලියෝන් ඔටෝ ඉංජිනියරින් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 103212
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 52/1, 9 වැනි පටුමග, ඇතුල් කෝට්ටේ, රාජගිරිය
ලියාපදිංචි දිනය : 2015.01.07

ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු.

02-67

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දැන්වමු.

සමාගමේ නම : වෙරි ලේන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 102467
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : විල්ල "ඒ" නිසල විල්ලාස්, එපිටමුල්ල පාර, කඹුරුගමුව, මාතර.
ලියාපදිංචි දිනය : 2014.11.27

සමාගමේ නම : ඩොල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 102469
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : විල්ල "ඒ" නිසල විල්ලාස්, එපිටමුල්ල පාර, කඹුරුගමුව, මාතර.
ලියාපදිංචි දිනය : 2014.12.01

ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු.

02-68

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන වෙළඳ සමාගම් ආඥාපනතේ 9 (2) ජේදය අනුව මෙයින් දන්වා සිටින වග නම් -

වෙළඳ සමාගමේ නම : ලෝටස් සේෆ්ටි ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 102400
ලියාපදිංචි කළ දිනය : 2015 ජනවාරි 07
ලියාපදිංචි කාර්යාලය : අංක 97 ඒ, ගාළු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂක.

02-99

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ, රාජගිරිය, නානායක්කාර මාවතේ, ගෝතමී පෙදෙසෙහි අංක 133/11 ඒ දරන ස්ථානයේ පදිංචි ශිරාල් පරාක්‍රම මෙන්ඩිස් (අංක 653251238 වී දරන ජාතික හැඳුනුම්පත්‍රය හිමි) වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ එහි පොදු මහජනතාව වෙත ලියා දන්වන වගනම් මා විසින් එකී ජනරජයේ, රාජගිරිය, නානායක්කාර මාවතේ, ගෝතමී පෙදෙසෙහි අංක 133/11 ඒ දරන ස්ථානයෙහි පදිංචි ගීතා ජයසේකර මෙන්ඩිස් (අංක 408620694 වී දරන ජාතික හැඳුනුම්පත්‍රය හිමි) වෙත ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජේ. අමදෝරු විසින් සහතික කරන ලද අංක 763 හා 2006 පෙබරවාරි මස 09 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද බව සහ මෙතැන් සිට එකී ඇටෝර්නි බලපත්‍රය මාර්ගයෙන් සිදුකරනු ලබන කිසියම් ගනුදෙනුවකට මාගේ වගකීමක් නොමැති බවය.

ශිරාල් පරාක්‍රම මෙන්ඩිස්.

2015 ජනවාරි මස 18 වැනි දින

02-216

---

### සමාගමක් සංස්ථාපිත කළ බවට ප්‍රසිද්ධ කිරීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ඩිල්මා මොඩර්න් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

ලියාපදිංචි අංකය : පී වී 103242
ලියාපදිංචි කාර්යාලය : අංක 546/3, මිහිඳු මාවත, අතුරුගිරිය පාර, මාලඹේ.

02-224/1

---

### සමාගමක් සංස්ථාපිත කළ බවට ප්‍රසිද්ධ කිරීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ඩිල්මා කැපිටල් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

ලියාපදිංචි අංකය : පී වී 103353
ලියාපදිංචි කාර්යාලය : අංක 546/2, මිහිඳු මාවත, අතුරුගිරිය පාර, මාලඹේ.

02-224/2

---

### සමාගමක් සංස්ථාපිත කළ බවට ප්‍රසිද්ධ කිරීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පෙට්‍රෝලියම් සිස්ටම් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

ලියාපදිංචි අංකය : පී වී 103244
ලියාපදිංචි කාර්යාලය : අංක 546/4, මිහිඳු මාවත, අතුරුගිරිය පාර, මාලඹේ.

02-224/3

---

### සමාගමක් සංස්ථාපිත කළ බවට ප්‍රසිද්ධ කිරීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව දේසිංහ පතිරගේ මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම සංස්ථාපනය කරන ලදී.

ලියාපදිංචි අංකය : පී වී 103243
ලියාපදිංචි කාර්යාලය : අංක 546/5, මිහිඳු මාවත, අතුරුගිරිය පාර, මාලඹේ.

02-224/4

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ජේ ඒ එස් ලංකා ඔයිල් (පී වී ටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පී වී 101226
ලියාපදිංචි ලිපිනය : අංක 61/101, හන්තාන පාර, නුවර.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

02-109

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : මාස්ටර් හෝල්ඩිං අයගම (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 103152
ලියාපදිංචි ලිපිනය : අංක 306/5, මහල්වරාව, පන්නිපිටිය.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

02-110

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : රදැල්ල ජේම්ස් ඇන්ඩ් ජුවෙලරි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 102567
ලියාපදිංචි ලිපිනය : කොළඹ ගෝල්ඩ් සෙන්ටර්, අංක 82, සුපර් මාකට්, අබ්දුල් කාදර් මාවත, පිටකොටුව, කොළඹ.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

02-111

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : හල්ඔය මිනි හයිඩ්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 101563
ලියාපදිංචි ලිපිනය : කළුගල, පිටවල.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

02-112

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බවට මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සී
සමාගමේ අංකය : පී කියු 233
ලියාපදිංචි ලිපිනය : අංක 73/5, ගාලු පාර, කොළඹ 03
සංස්ථාගත කළ දිනය : 2015 ජනවාරි මස 06 වැනි දින.

ආර්. ඒ. පී. විතාන,
සමාගම් ලේකම්.

02-135

---

## යුනයිටඩ් ඩෙන්ඩ්‍රෝ එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්

(පී වී 16903) ණය හිමියන් විසින් ස්වේච්ඡාවෙන් ගණුදෙනු බේරා වසා දැමීම පිළිබඳ රැස්වීමේ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 334(2) වගන්තිය යටතේ, ඉහත නම් සඳහන් සමාගමේ ණය හිමියන්ගේ රැස්වීමක් පහත සඳහන් අරමුණු සඳහා 2015 පෙබරවාරි මස 09 වැනි දින පෙ. ව. 10.30 ට රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 100/1 හි දී පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

* සමාගමේ කටයුතු පිළිබඳ තත්ත්ව ප්‍රකාශය සමාලෝචනය කිරීම
* ගමේ ණය හිමියන් විසින් ස්වේච්ඡාවෙන් ගනුදෙනු බේරා වසා දැමීම අනුමත කිරීම/සලකා බැලීම
* 2007 අංක 07 දරන සමාගම් පනතේ, 335 වන වගන්තිය ප්‍රකාර ඈවරකරුවෙකු පත් කිරීම.

යුනයිටඩ් ඩෙන්ඩ්‍රෝ එනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

LOLC කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

2015 ජනවාරි 19 වැනි දින.

02-129

---

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම පිළිබඳ දැන්වීම

පානදුර, ඇටඹගොඩ, ජනජය මාවත, අංක 26/1/සී හි පදිංචිව සිට ගල්ෆ් ඉන්කොන්, තැපැල් පෙට්ටිය 4076, දෝහා කටාර් හි පදිංචි පේදුරුව හන්දිගේ ප්‍රදීප් කුමාර සිල්වා වන මම මාගේ ඇටර්නි බලකාරිය ලෙස පානදුර ඇටඹගොඩ, ජනජය මාවත, අංක 26/1/සී හි පදිංචිව සිට ගල්ෆ් ඉන්කොන් තැපැල් පෙට්ටිය 4076 දෝහා කටාර් හි පදිංචි ජුවන් හැන්නැදිගේ දිනූෂා හෂාන්ති පත් කරමින් සකස් කල යූ. ජී. ජේ. චන්දන ගමගේ ප්‍රසිද්ධ නොතාරිස් තැන 2011 වන වර්ෂයේ නොවැම්බර් මස 07 වැනි දින ලියා සහතික කල අංක 50 දරන ඇටර්නි බලපත්‍රය බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ 11062 දිනපොත් අංකය යටතේ 2011.11.14 වැනි දින ලියාපදිංචි වී ඇති ඇටර්නි බලපත්‍රය අද දින එනම් 2014.12.18 වැනි දින සිට බලපැවැත්මක් නොමැති බවත් එය අවලංගු කරන බවත් සියලුම දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

කේ. සුදත් ඩී. දල්පතාදු.

02-140

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නම : ඕ එස් එස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 100005
ලියාපදිංචි දිනය : 2014 ජූලි 31
ලියාපදිංචි ලිපිනය : අංක 53 ඒ, කඩවල පාර, පන්නිපිටිය.

අධ්‍යක්ෂක.

02-152

## ප්‍රසිද්ධ දැන්වීමයි

සමාගමක් සංස්ථාගත කළ බව 2007 අංක 7 දරන පනතේ 9 වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රසිද්ධ කෙරේ.

සමාගමේ නම : සමස්ථ ලංකා වෘත්තීය ඡායාරූප ශාලා හිමියන්ගේ සංගමය
ලියාපදිංචි අංකය : පී වී ජීඒ 3005
ලියාපදිංචි ලිපිනය : නිරෝෂ් ස්ටුඩියෝ, අංක 348/2, නව නුවර පාර, දෙල්ගොඩ.

02-148

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ බී පී ඕ මාස්ටර් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2014ක් වූ නොවැම්බර් මස 12 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : බී පී ඕ මාස්ටර් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 102170
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 45/25එච්, හික්ගහවත්ත මාවත, පැපිලියාන

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

එච්. ඩී. සී. ඩී. විජේසිංහ,
ලියාපදිංචි ලේකම්වරිය.

02-155

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

සමාගම් නාමය : ලූ ෂෝව් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 1012700
ලියාපදිංචි ලිපිනය : අංක 11, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08

අතුලසිරි රනගල,
අධ්‍යක්ෂ/සමාගම් ලේකම්.

02-177

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

කොළඹ 10, මාලිගාවත්ත මහල් නිවාස, අංක 2/4 බී 51, දරන ස්ථානයේ පදිංචි කුසල පුෂ්පකුමාර තෙන්නකෝන් වන මා අංගොඩ, දෙල්ගහවත්ත අංක 219/ඒ දරන ස්ථානයේ පදිංචි සුජිත් සමන්ත රණ්ජු තෙන්නකෝන් (630182042 වී) යන අය වෙත ඇටර්නි බලය පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් යූ. ජී. මහින්ද මහතා විසින් ලියා සහතික කළ අංක 255 සහ වර්ෂ 2001 ජූලි 20 දිනත් දරන ඇටර්නි බලපත්‍රයට අදාළව මා විසින් දෙන ලද ඇටර්නි බලය මෙයින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ට කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට මා වෙනුවෙන් මාගේ ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ගනුදෙනුවකට මා වග නොකියන බව ද මෙයින් දන්වා සිටිමි.

02-179

## දැන්වීමයි

අංක 40, මීගමු පාර, වත්තල පදිංචි නිත්තියානන්දන් සෝමසුන්දර මූර්ති (ජා. හැ. අංක 670620875 වී) වන මම 30 වැනි දින මැයි මස 2013 වර්ෂයේ එම්. සසාන්ගන් නීතිඥවරයා විසින් ලියාපදිංචි කළ අංක 996 දරන ඇටෝර්නි බලපත්‍රය අංක 364 අලුත් මාවත පාර, කොළඹ 15 පදිංචි නිත්තියානන්දන් ජීවරත්නම් (ජා. හැ. අංක 691670686 වී) දරන අයට පැවරූ සෑම බලයක්ම අද 2014.12.29 සිට අවලංගු කරමි.

02-159

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පූගොඩ, කෙලින් වීදිය, අංක 180 හි පදිංචි දයානි චිරංජලා වර්ණකුල, විවාහයෙන් පසුව දයානි චිරංජලා ඩිරෝස් වන මා විසින් වර්ෂ 2012.09.05 දිනැතිව පාලිත කරඳන ප්‍රසිද්ධ නොතාරිස් තැන ඉදිරිපිට දී ලියා සහතික කරන ලද අංක 1772 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් පූගොඩ, සෙනසුන්ගොඩ, අංක 47/ඒ හි පදිංචි දෝන දීපානි ප්‍රියංගලා වර්ණකුල යන අයට පැවරූ සියලු හිමිකම් මෙයින් අවලංගු කර සිටිමි. එකී ඇටෝර්නි බලපත්‍ර අවලංගුව 2014.02.03 වැනි දින සිට බලපැවැත්වෙන බවටත්, එමගින් සිදු කරනු ලබන සියලු කටයුතු නීත්‍යානුකූල නොවන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

දයානි චිරංජලා වර්ණකුල,
විවාහයෙන් පසුව දයානි චිරංජලා ඩිරෝස්
(ඇටෝර්නි අධිපති)

02-271

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| 1. ද ආර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 103218 | 2015.01.07 | අංක 329/122, 2 වැනි පටුමග, ලේක් ක්‍රෙසන්ට්, අත්තිඩිය |
| 2. ලෙවල් ලොක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 103370 | 2015.01.20 | අංක 125, දෙහිවල පාර, බොරලැස්ගමුව |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-191

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. එල්. එම්. සුහී සහ ජේ. මුහීතා.
ගිණුම් අංක : 0112 5000 0679.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014 ඔක්තෝබර් මස 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් හතර ලක්ෂ හත් දහස් තුන්සිය හැට එකයි ශත අනූ දෙකක (රු. 54,07,361.92) මුදල ද, 2014 සැප්තැම්බර් මස 11 වැනි දින සිට අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් නව ලක්ෂයක (රු. 49,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නවයක් (19%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2015.01.02 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2014.12.12 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2015.02.25 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ නින්තාවූර්පත්තුවේ නින්තාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ නින්තාවූර් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි "තමරායිකුලම් වෙඩ්ඩුකඩු" යයි කියනු ලබන වඩා විශාල ඉඩමේ කොටසක් වන ඉඩමට බලයලත් මානක තැන අහමඩ් එම්. මහරූෆ් යන අය විසින් සාදන ලද 2008 ජුනි මස 02 දාතම හා අංක 3878 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පී. ටී. ඒ. උසනාර් ලෙබ්බේ යන අයට අයිති ඉඩම, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 2, දකුණට : යූ. එල්. මාරියන්කන්ඩු යන අයට අයිති ඉඩම සමග ප්‍රධාන පාර වෙත දිවෙන (නින්තාවූර් මහජන වෙළඳපොළ සඳහා යෝජිත) මාර්ග අයිතිය ද සමග සහ බස්නාහිරට : කුඹුර සමග එහි පිහිටි සෑම සියලු දේ සමග සම්පූර්ණයෙන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රචශතාවයන් පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමග වෙළුම/පත්‍රිරුව එල් 82/70 යටතේ කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන අහමඩ් එම්. මහරූෆ් යන අය විසින් සාදන ලද 2013 ජනවාරි මස 07 දාතම හා අංක 13011 දරන පිඹුරේ මෑත දී කරන ලද මිනුමකට අනුව විස්තර පහත සඳහන් පරිදිය.

එකී නින්තාවූර්පත්තුවේ නින්තාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ නින්තාවූර් පිහිටි "තමරායිකුලම් වෙඩ්ඩුකඩු" යයි කියනු ලබන ඉඩම් කොටසට මායිම්, උතුරට : පී. ටී. ඒ. උසනාර් ලෙබ්බේ අය අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : බලයලත් මානක තැන අහමඩ් එම්. මහරූෆ් යන අය විසින් සාදන ලද 2008 ජුනි මස 02 දාතම හා අංක 3878 දරන මිනුම් පිඹුරේ ලොට් 2 දකුණට : පාර සහ බස්නාහිරට : එස්. ඉබ්රා ලෙබ්බේ යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) හෝ හෙක්ටයාර් 0.101ක් විශාල ඉඩම් කොටස සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

02-184

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඒ. එල්. මොහොමඩ්.
ගිණුම් අංක : 0161 5000 0096.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2014 ඔක්තෝබර් මස 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අසූ දෙලක්ෂ තිස් දෙදහස් නවසිය හැට එකයි ශත පනහක (රු. 82,32.961.50) මුදල ද, 2014 සැප්තැම්බර් මස 20 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් තුන් ලක්ෂ හැත්තෑ පන් දහසක (රු. 33,75,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නවයක් (19%) හා තවත් රුපියල් විසි ලක්ෂයක (රු. 20,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2014.12.19 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2014.12.05 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2015.02.23 වැනි දින ප. ව. 3.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වෙල්ලස්ස කොට්ඨාසයේ බිබිලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වැගම්පත්තු කෝරළේ පිහිටි "දෙවෙනිලන්ද' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. බී.

අත්තනායක යන අය විසින් සාදන ලද 2000 දෙසැම්බර් මස 25 දාතම හා අංක MO/455 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මානක තැන එල්. කේ. ගුණසේකර යන අය විසින් සාදන ලද 1996 අගෝස්තු මස 18 දාතම හා අංක 626 දරන පිඹුරේ ලොට් 5 බී, නැගෙනහිරට : අංක 626 දරන එකී පිඹුරේ ලොට් 04 දකුණට : පාර සහ බස්නාහිරට : බලයලත් මානක තැන ටී. බී. අත්තනායක යන අය විසින් සාදන ලද 2000 ඔක්තෝබර් මස 08 දාතම හා අංක 438 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් බිංදුවයි හයයි දශම හයයි හතක් (අ. 0, රූ. 0, පර්. 6.67) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව කේ 72/301 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

02-185

---

**මහජන බැංකුව - ආයතනික බැංකු අංශය**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ මහර ප්‍රාදේශීය සභා සීමාවට අයත්, ගොනාහේන ග්‍රාමයේ පිහිටි, මිල්ලගහවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු පී. එම්. ලීලාරත්න විසින් සාදන ලද 2000 ජනවාරි මස 05 වැනි දිනැති අංක 24 දරන පිඹුරේ ලොට් අංක ඒ ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 02, පර්. 29

ඉහත කී අංක 24 දරන පිඹුරට අනුව ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක සී 628/147 සහ 628/623 යටතේ ලියාපදිංචි කර ඇත. එහි පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියල්ල සහිතව.

*දේපළ වෙත පිවිසීම.* - කොළඹ සිට නුවර පාර ඔස්සේ කිලෝමීටර් 18ක් පමණ ගමන් කර ගොනාහේන පාරට ලගාවන්න. එතැන් සිට කිලෝමීටර් 2.5ක් දුරින් ඇති මහකඩේ මංසන්ධියට පිවිසෙන්න. එතැනින් වමට ඇති මීගහවත්ත පාරට හැරී කිලෝමීටර් 1.5ක් පමණ ගමන් කරන්න. අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2015 පෙබරවාරි මස 26 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉහත කී දේපළ, ගාමන්ට් ගෲප් 5 ප්‍රයිවට් ලිමිටඩ් විසින් මහජන බැංකුව වෙත උකස් කරන ලද්දකි.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2010 මැයි මස 31 වැනි දින පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2ක් (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව)ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු ණය අයකර ගැනීම්, ආයතනික බැංකු අංශය, මහජන බැංකුව, අංක 35, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ගෙවිය යුතු වේ. දුරකථන අංක : 2320651 - 6/2437239 - 41.

ඔප්පු සහ අනෙකුත් ලියකියවිලිවල පිටපත් ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි".

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්
වසර 123 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

02-186

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී - නගර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවේ කොට්ඨාස අංක 6 හි කළුබෝවිල ශ්‍රී සරණංකර පාරේ වරිපනම් අංක 69ඒ, 69ඒ 1/1 සහ 69ඒ 2/1 දරන මාපිටිය කුඹුර නමැති ඉඩමට එහි ඇති ගොඩනැගිලි ගහකොළ හා අනෙකුත් සියලු දේ සමග බෙදා වෙන් කොට බලයලත් මිනින්දෝරු ජී. බී. දොඩංවල විසින් 1997 ජූලි මස 15 වැනි දින සාදන ලද පිඹුරු අංක 2673 දරන පිඹුරේ ලොට් ඒ දරන කැබැල්ලට (නැවත මැන බෙදා වෙන්කොට 1982 මාර්තු මස 18 වැනි දින සාදන ලද මිනුම්පති විසින් සහතික කරන ලද පිඹුරු අංක 5708 හි) ලොට් 2 දරන පර්චස් හයයි දශම බිංදුවයි හතක් (අක්. 0 රූ. 0 පර්. 6.07) නොහොත් හෙක්ටයාර් 0.01535.

මොහොමඩ් හුසෙන් මොහොමඩ් හුසෙයිෆ් යන අය ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2015ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.11.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, 2013.11.11 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.02.06 වැනිදින *රජයේ ගැසට් පත්‍රයද*, 2015.02.09 වැනිදින ලක්බිම ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - ගාළු පාරේ සිට දෙහිවල දක්වා ගමන් කළ විට රෝහල පාර හංදිය හමුවේ. එතැනින් වමට හැරී රෝහල පාරේ ගමන් කළ විට සරණංකර පාර හමුවේ. එම පාරේ මීටර් 400ක් පමණ ගිය විට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දි 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නගර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමණාකරු- ණය අයකර ගැනීම්,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 21, ශ්‍රීමත් රාසික් ෆරීඩ් මාවත, කොළඹ 01.
දුරකථන අංක : 011- 2486770,
ෆැක්ස් අංකය : 011- 2347717.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජොෂ්ඨ වෙන්දේසිකරු
තක්සේරුකරු උසාවි කොමසාරිස්.
අංක 182, 3 වැනි මහල උසාවි පාර, කොළඹ 12,
දුරකථන/ෆැක්ස් : 011 2445393.
ඊමේල් : senaservice@sltnet.lk

02-157

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී - හම්බන්තොට ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ මැද පත්තුවේ, ගම්පහ මහ නගර සභා සීමාව තුළ කෙහෙල්වතුගොඩ පිහිටි යක්කලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. එම්. ආරියසේන විසින් 2005 පෙබරවාරි මස 20 වැනි දින සාදන ලද අංක 1953 ඒ දරන පිඹුරේ ලොට් ඒ දරන ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් එකයි දශම නමයක් (අ. 0 රූ. 1 පර්. 1.9) විශාල ඉඩම සමග ඒ තුළ පිහිටි ගොඩනැගිලි සහ සියලුදේත් සමග වේ.

පිඹුරු අංක 1953 ඒ හි සඳහන් මාර්ග වෙන් කිරීමට නිදහසේ ඇතුල්වීම ආපසු ඉන් පිටවීම පා ගමනින් හෝ වෙනත් ක්‍රමයකින් එහා මෙහා යෑම වාහනයකින් භාණ්ඩ ඇතුව හෝ නැතිව එහා මෙහා යෑම වෙන්කිරීම මතු පිටින් හෝ පොළොව යටින් විදුලිය සැපයුම් ජල සැපයුම් අපජල නල සවිකිරීම හෝ වෙනත් පහසුකම් සපයා ගැනීමට ඇති නිදහස් සහ පූර්ණ අයිතිය ඇතිව වේ.

දෙවන උපලේඛනය

1. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිට කෝරළයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 26 ඒ ඉගල වසමේ ඇල්පිටිය ඉගල පිහිටි කොහිලගල ඔකඳගේන සහ ගුලනේකන්ද ඉඩමෙ ලොට් 1 සහ 2 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. තේජසිරි විසින් 2012 මැයි මස 08 වැනි දින සාදන ලද අංක 151 A/2012 දරන පිඹුරේ ලොට් AB වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට පර්චස් පහයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 5.50) විශාල ඉඩම සමග ඒ තුළ පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියලු දේත් සමග වේ.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තොට වලල්ලාවිට කෝරළයේ , ඇල්පිටිය ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව තුළ 26 ඒ ඉගල ග්‍රාම නිලධාරී වසමේ ඇල්පිටිය ඉගල පිහිටි කොහිලගල ඔකඳගේන සහ ගුලනේකන්ද ඉඩමේ ලොට් 1 සහ 2 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. තේජසිරි විසින් 2000 අගෝස්තු මස 09 වැනි දින මැන සාදන ලද අංක 784 ඒ දරන පිඹුරේ ලොට් ඒඑච් වශයෙන් දැක්වෙන ඉඩම් කොටස මතු පිටින් ඇතුල්වීම නැවත පිටවීම නිදහසේ එහා මෙහා යෑම එහි විදුලිය කනු සවිකිරීම මතුපිටින් හෝ

පොළවට යටින් ජලනළ එලීම සහ වෙනත් සැපයුම් සඳහා අවශ්‍ය පහසුකම් ඇති කර ගැනීම සඳහා වූ නිදහස් අයිතිය තිබිය යුතු මෙම ඉඩම් කොටස ප්‍රමාණය රූඩ් දෙකයි පර්චස් විසි දෙකක් (අ. 0, රූ. 2, පර්. 22) විශාල ඉඩම සමග ඒ තුළ පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියලු දේත් සමග වේ.

එකී පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ හම්බන්තොට පරණ තංගල්ල පාරේ අංක 202/බී, දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාව තුළ නිත්‍යානුකූලව සමාගමක් වශයෙන් ස්ථාපිත ජේ. බී. ඉංජිනියරින් කම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස හපුආරච්චිගේ කමල් දයානන්ද සේනාරත්න උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කර ඇත.

මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ හම්බන්තොට පරණ තංගල්ල පාරේ අංක 202/බී, දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාව තුළ නිත්‍යානුකූලව සමාගමක් වශයෙන් ස්ථාපිත ජේ. බී. ඉංජිනියරින් කම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ ගම්මැද්දේ හේවා උපුල් චන්දන ජයසේකර උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කර ඇත.

පළමුවන උපලේඛනයේ සඳහන් දේපළ (අ. 0, රූ. 1, පර්. 1.9) වර්ෂ 2015ක් වූ මාර්තු මස 04 වැනි දින පෙ. ව. 11.00 ට

දෙවන උපලේඛනයේ සඳහන් දේපළ (1) ලොට් 30 සහ 31 (අ. 5 රූ. 0 පර්. 0) හෙවත් හෙක්ටයාර් 2.020 (2) ලොට් ඒබී (අ. 0, රූ. 0, පර්. 5.50) වර්ෂ 2015ක් වූ මාර්තු මස 06 වැනි දින පෙ.ව . 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.09.19 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.02.06 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, 2015.02.06 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - යක්කල නගරයේ සිට (ඔරලෝසු කණුව ළඟින්) නුවර ප්‍රධාන පාරේ (ඒ 1) කොළඹ දෙසට මීටර් 150ක් පමණ ගමන් කළ විට චන්ද්‍රජෝති විද්‍යාලය හමුවේ. එතැනින් දකුණට හැරුණු විට ඇති රූගල්වත්ත පාරේ මීටර් 100ක් පමණ ඉදිරියට ගිය විට තුන්මන් හංදියක් හමුවේ. අවසාන වශයෙන් වමට හැරී මීටර 150ක් පමණ ඉදිරියට ගියවිට අදාළ දේපළට ලඟාවිය හැකි අතර මෙම දේපළ වම්පසින් පිහිටා ඇත.

**2 වන උපලේඛනය**

බටුවන්හේන පාසැල ළඟින් වමට හැරී බටුවන්හේන පාර ඔස්සේ ගමන්කර ඉගල්ගොඩ පටුමඟ 11 හමුවේ. එතැනින් ඉගල්ගොඩ පටුමඟ 11 මීටර් 100ක් පමණ ඉදිරියට ගමන්කර වමට හැරී මීටර් කිහිපයක් ගිය පසු අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් අකාලික වටිනාකම බද්ද (VAT) ගෙවිය යුතුයි (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ හම්බන්තොට ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
තක්සේරුකරු උසාවි කොමසාරිස්,
අංක 182, 3 වැනි මහල උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් 011 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 104 ඒ, මහා වීදිය,
හම්බන්තොට
දුරකථන අංක : 047 2222887/047 -2222888-9,
ෆැක්ස් අංකය : 047 -2222890.

02-158

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## *උපලේඛනය*

**2015**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| පෙබරවාරි | 2015.02.06 | සිකුරාදා | 2015.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.13 | සිකුරාදා | 2015.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.20 | සිකුරාදා | 2015.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.27 | සිකුරාදා | 2015.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2015.03.06 | සිකුරාදා | 2015.02.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.13 | සිකුරාදා | 2015.02.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.20 | සිකුරාදා | 2015.03.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.03.27 | සිකුරාදා | 2015.03.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2015.04.02 | බ්‍රහස්පතින්දා | 2015.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.10 | සිකුරාදා | 2015.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.17 | සිකුරාදා | 2015.04.02 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.04.24 | සිකුරාදා | 2015.04.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.04.30 | බ්‍රහස්පතින්දා | 2015.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.